# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2017

## (AA26) ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග

(Business Management and strategy)

---

මෙම ප්‍රශ්න පත්‍රය **A, B, C, D** යනුවෙන් කොටස් හතරකින් යුක්තව ප්‍රශ්න 10 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්න සඳහා උත්තර ලිවීම අනිවාර්ය වේ.

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය මුළු විෂය නිර්දේශයම ආවරණය වන පරිදි සැකසුන ප්‍රශ්නයකි. අනු ප්‍රශ්න 10 කින් සමන්විත වන අතර එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 20 කි.

**1.1 සිට 1.5** දක්වා දී ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරාගෙන, තෝරාගත් උත්තරයට අදාල අංකය පමණක් උත්තර පත්‍රයේ ලිවිය යුතු විය. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව උපදෙස් පිළිපැද උත්තර ඉදිරිපත් කර තිබුණද සමහර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේම උත්තර සපයා තිබීම හා තෝරාගත් අංකය වෙනුවට උත්තරය සම්පූර්ණයෙන්ම ලියා තිබීම වැනි පොදු අඩුපාඩු ද දක්නට තිබුණි.

**1.6 සිට 1.10** දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය බව උත්තර පත්‍රයේ ලිවිය යුතු විය. මෙහිදී ද සමහර අයදුම්කරුවන් උපදෙස් නියමාකාරව පිළිපැද නොමැති අවස්ථා දක්නට තිබුණි. සත්‍ය යන්නට √ ලකුණද , අසත්‍ය යන්නට X ලකුණද යොදා තිබූ අවස්ථා මෙන්ම, තෝරාගත් උත්තරය ඒ ආකාරයෙන්ම උත්තර පොතේ ලියා තිබූ අවස්ථාද දක්නට ලැබුණි. මෙවැනි සිදුවීම් ඇතිවීමට හේතුව අයදුම්කරුවන් දී ඇති උපදෙස් නිසි පරිදි අවබෝධ කර නොගැනීමය.

සමස්ථයක් වශයෙන් මෙම කොටස සඳහා වෙන්කළ ලකුණු ප්‍රමාණයෙන් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අයදුම්කරුවන්ගෙන් වැඩිදෙනෙක් සමත් විය. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉතාමත් සාර්ථක මට්ටමක පැවතුණි.

## B කොටස

මෙම කොටස ප්‍රශ්න පහකින් සමන්විත වූ අතර එක් ප්‍රශ්නයකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 25 කි.

### ප්‍රශ්න අංක 02

හෙන්රි ෆෙයොල් විසින් හඳුන්වා දෙන ලද කළමනාකරණ මූලධර්ම 5 ක් සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබුණි. හෙන්රි ෆෙයොල් විසින් හඳුන්වා දෙන ලද මූලධර්ම 14 අතුරෙන් ඕනෑම කරුණු 5 ක් සඳහා මුළු ලකුණු ලබාගත හැකිව තිබුණි. මෙය ඉතාමත් පහසු ප්‍රශ්නයකි. සමහර අයදුම්කරුවන් අදාල නොවන කරුණු විස්තරාත්මක ලෙස ඉදිරිපත් කිරීම හා උත්තර නොදන්නාකම නිසා අදාල නොවන මොනවාහරි දෙයක් ලියා තිබූ අවස්ථා ද දක්නට තිබුණි. කෙසේනමුත්, සමස්ථයක් ලෙස ගත්කළ මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉතා හොඳ මට්ටමක පැවතුණි.

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් අධිකාරිත්වය හා වගකීම අතර සම්බන්ධතාවය පැහැදිලි කිරීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කර තිබුණි. මෙම සංකල්ප දෙකෙහි සම්බන්ධතාවය පැහැදිලි කිරීමේදී එක් එක් සංකල්පයෙහි අර්ථය වෙන වෙනම පැහැදිලි කර ඒවා අතර සම්බන්ධතාවය පැහැදිලි කළ යුතුව තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම සංකල්ප දෙක පැහැදිලිව ඉදිරිපත් කර නොතිබුණි. ඉතාමත් සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය සඳහා සාර්ථකව උත්තර සපයා සම්පූර්ණ ලකුණු ලබා තිබුණි. මෙම ප්‍රශ්නයට සපයා තිබූ දුර්වල උත්තර වලින් මෙවැනි සරල සංකල්ප පිළිබඳව පවා අයදුම්කරුවන් තුළ මනා අවබෝධයක් නොමැති බව පැහැදිලි විය.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නයෙන් සඵලදායී සන්නිවේදනය සඳහා සපුරාලිය යුතු කොන්දේසි 5 ක් සඳහන් කිරීම අපේක්ෂා කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් අපේක්ෂිත උත්තරය නිවැරදිව ඉදිරිපත් කර මුළු ලකුණු ලබාගැනීමට සමත් වූහ. ඇතැම් අයදුම්කරුවන් සඵලදායී සන්නිවේදනය සඳහා සපුරාලිය යුතු කොන්දේසි සන්නිවේදන ආකෘතියේ මූලිකාංග සමග වරදවා තේරුම්ගෙන තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් තොරතුරුවල ලක්ෂණයන් එකින් එක පැහැදිලි කරමින් දීර්ඝ උත්තර ලියා තිබුණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු නොකොට අනවශ්‍ය ලෙස දීර්ඝ විස්තර සපයමින් විභාගය සඳහා දී ඇති කාලය අපතේ යවා තිබූ අවස්ථා ද බහුලව නිරීක්ෂණය විය. එමෙන්ම එකම කරුණ නැවත නැවත ලියා තිබූ අවස්ථාද දක්නට තිබුණි.

## ප්‍රශ්න අංක 05

ආයතනයක සේවකයන් ප්‍රතිප්‍රේරණය වී ඇති බව අඟවන සංඥා 5 ක් සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබුණි. ඉතාමත් පහසු ප්‍රශ්නයක් වූ මේ සඳහා අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ඉතා සාර්ථකව උත්තර සපයා තිබුණි. එසේම අතලොස්සක් වූ අයදුම්කරුවන් ප්‍රශ්නයට අවතීර්ණ වීමටවත් උත්සාහා කර නොතිබූ බව දක්නට ලැබුණි. සමහර අයදුම්කරුවන් අභිප්‍රේරණය හා ප්‍රතිප්‍රේරණය යන වචන දෙක පටලවාගෙන සේවකයන් අභිප්‍රේරණය වූ බව හඟවන සංඥා ඉදිරිපත් කර තිබූ අවස්ථා ද දක්නට තිබුණි. තවද ඇතැම් අයදුම්කරුවන් සේවකයින්ව අභිප්‍රේරණය කළ යුත්තේ කෙසේදැයි පැහැදිලි කර තිබුණි. අයදුම්කරුවන් විසින් උත්තර සැපයීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා නිවැරදිව අවබෝධ කරගත යුතුව ඇත.

## ප්‍රශ්න අංක 06

පාලනයේ ප්‍රයෝජන 5 ක් සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබුණි. ඉතාමත් පහසු ප්‍රශ්නයක් වුවද ප්‍රශ්නය නිසිපරිදි තේරුම් නොගෙන පාලනය යනු කුමක්ද? පාලනය කළ හැක්කේ මොනවාද? යන්න පිළිබඳව ඇතැම් අයදුම්කරුවන් දීර්ඝ ලෙස අදාළ නොවන කරුණු ලියා තිබූ අවස්ථාද දක්නට ලැබුණි. එමෙන්ම එකම ප්‍රයෝජනය කිහිප ආකාරයකට නැවත නැවත ලියා තිබූ අවස්ථා ද දක්නට ලැබුණි. කෙසේනමුත් මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉතාමත් හොඳ මට්ටමක පැවතුණි.

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

### ප්‍රශ්න අංක 07

කළමනාකරණයේ එන නායකත්වය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමුකළ ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වූ අතර දැනුම, අවබෝධය හා භාවිතය යන අංග ආවරණය වන ලෙස ප්‍රශ්නය සකස් වී තිබුණි. පළමු කොටසින් නායකයෙකු හා කළමනාකරුවෙකු අතර ඇති වෙනස්කම් 3 ක් පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. වෙනස්කම් පැහැදිලි කිරීමේදී නායකයා යනු කවරෙක්ද? යන්න හඳුනාගෙන දෙදෙනා අතර ඇති වෙනස්කම් පැහැදිලි කළ යුතු විය. අයදුම්කරුවන්ගෙන් බහුතරය මේ සඳහා නිවැරදි උත්තර සපයා ලකුණු ලබාගෙන තිබුණි.

ඇතැම් අයදුම්කරුවන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි වූයේ එක් කරුණක් පමණක් ගෙන එය අනවශ්‍ය ලෙස දීර්ඝව පැහැදිලි කර තිබීම නිසාවෙනි. අදාල විෂය කරුණු මැනවින් හදාරා පෙර සූදානමක් සහිතව විභාගය සඳහා ඉදිරිපත් වූයේ නම් අයදුම්කරුවන්ගෙන් බහුතරයකට මෙම ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු ලබා ගැනීමට හැකියාව තිබුණි.

මෙම ප්‍රශ්නයේ දෙවැනි කොටසින් නායකත්ව ලක්ෂණ එසේත් නැත්නම් නායකත්ව ගුණාංග 4 ක් සඳහන් කිරීමට තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සාර්ථක ලෙස උත්තර ලියා තිබූ අතර, ඇතැම් අයදුම්කරුවන් උත්තර ලිවීමේදී එකම ගුණාංගයට සමාන පද ද ලියා තිබූ අවස්ථා දක්නට තිබුණි. නායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග 4 ක් නිවැරදිව සඳහන් කර තිබුණේ නම් අයදුම්කරුවන්ට මෙම සරල ප්‍රශ්නය සඳහා වෙන්කළ මුළු ලකුණු ප්‍රමාණයම ඉතා පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව තිබුණි.

### ප්‍රශ්න අංක 08

සංවිධානයකට සඵලදායී සංවිධාන ක්‍රියාවලියකින් ලැබෙන ප්‍රයෝජන 4 ක් සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබුණි.

මෙම ප්‍රශ්නයේ (b) කොටසට සාපේක්ෂව (a) කොටස සඳහා අයදුම්කරුවන් සාර්ථකව උත්තර සැපයීම සිදුකර ඇති බව නිරීක්ෂණය විය. එහෙත් සමහර අයදුම්කරුවන් නිවැරදි ලෙස ප්‍රශ්නය අවබෝධ කරගෙන නොතිබූ බව උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේදී දක්නට ලැබුණි. ලකුණු ලබා ගැනීම සඳහා සඵලදායී සංවිධාන ක්‍රියාවලියකින් ලැබෙන ප්‍රයෝජන 4 ක් සඳහන් කිරීම ප්‍රමාණවත් වුවත් ප්‍රශ්නයට අදාල නොවන වෙනත් කරුණු දීර්ඝ වශයෙන් විස්තර කර තිබූ අවස්ථා ද දක්නට ලැබුණි.

මෙම ප්‍රශ්නයේ (b) කොටසින් සඵලදායී සංස්කෘතියක් නිර්මාණය කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග 3 ක් පැහැදිලි කිරීම අපේක්ෂා කර තිබුණි. ප්‍රශ්නයේ මෙම කොටස අයදුම්කරුවන් විසින් නිවැරදිව අවබෝධ කරගෙන නොතිබීම නිසා හෝ මෙම විෂය කොටස පිළිබඳ දැනුවත් නොවී තිබීම නිසා සාර්ථක උත්තර ඉදිරිපත් කර තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකි. බහුතරයක් අයදුම්කරුවන්ගේ සංස්කෘතිය පිළිබඳ දැනුම සහ අවබෝධය ඉතාමත් අඩු මට්ටමක පැවති බව උත්තර ඉදිරිපත් කර තිබූ ආකාරයෙන් මනාව පැහැදිලි විය.

### ප්‍රශ්න අංක 09

වෙනස කෙරෙහි ඇති අකමැත්ත මැඩපවත්වා ගැනීමේ ක්‍රම 3 ක් පැහැදිලි කරන ලෙස මෙම ප්‍රශ්නයේ (a) කොටසින් විමසා තිබුණි. මෙහිදී අසන ප්‍රශ්නය කුමක්ද යන්න පළමුව නිවැරදිව තේරුම්ගත යුතුය. ඊට අදාල වනසේ අයදුම්කරුවන් විසින් උත්තර ඉදිරිපත් කළ යුතුය. ප්‍රශ්නයට අදාල නොවන දේවල් දීර්ඝ ලෙස ලිවීම නිසා කාලය අපතේ යාම පමණක් සිදුවේ. එවැනි සිද්ධීන් බහුලව දක්නට ලැබුණු අතර ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසක් පමණක් සාර්ථක ලෙස උත්තර ඉදිරිපත් කර තිබුණි.

මෙහි (b) කොටසින් සංවිධානයක සේවකයින්ගේ ආචාරශීලී නොවන හැසිරීම් වලට බලපාන සාධක 4 ක් සඳහන් කිරීමට නියමිතව තිබුණි. මෙහිදී විස්තර කිරීම අවශ්‍ය නොවූ අතර අදාල කරුණු 4 ක් ලිවීම පමණක් ප්‍රමාණවත් විය. මේ සඳහා බහුතරයක් අයදුම්කරුවන් වෙන්කළ මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් වූහ.

# D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

දෙන ලද සිද්ධියක් ආශ්‍රිතව උත්තර සැපයිය යුතු ප්‍රශ්නයකි. ලකුණු 25 ක් වෙන් කළ අනිවාර්ය ප්‍රශ්නයකි. පසුගිය වර්ෂ වලට සාපේක්ෂව අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ඇති බව නිරීක්ෂණය විය.

**(a) කොටස**

මෙවැනි ව්‍යුහාත්මක ප්‍රශ්නයකින් බලාපොරොත්තු වන්නේ කළමනාකරණ න්‍යායන් ප්‍රායෝගික තත්ත්වයන් හා ගැලපීමට අයදුම්කරුවන් සතු හැකියාවයි. ඒ අනුව ගැටළුව හොඳ අවබෝධයකින් කියවා එහි ඇති න්‍යායාත්මක කොටස් ප්‍රායෝගිකව අසා තිබූ ප්‍රශ්නවලට ගැලපිය යුතු විය. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට අවබෝධයක් නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ප්‍රශ්නයට කුමක් හෝ ලිවීමට උත්සාහා කර තිබුණි. මෙවැනි ප්‍රශ්නයකට උත්තර ලිවීමේදී විෂය කරුණු පිලිබඳව හොඳ අවබෝධයක් තිබිය යුතු වුවද ඒ සම්බන්ධව අවධානය යොමුකර නොතිබූ බව උත්තර පත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය. එසේම ඇතැම් අයදුම්කරුවන් සිද්ධිය තේරුම්ගෙන විෂය කරුණු සමග සම්බන්ධ කරමින් සාර්ථකව උත්තර ලියා තිබූ බවද දක්නට ලැබුණි.

ප්‍රශ්නයේ (a) කොටසින් සමාගමේ වර්තමාන තත්ත්වයට අදාලව තීරණ ගැනීම වැදගත් වන්නේ ඇයිදැයි විමසා තිබුණි. තීරණ ගැනීමේ වැදගත්කම් රාශියක් තිබුණද ඒවා **සීමාසහිත ඇග්‍රෝ මැක් පොදු සමාගමේ** පවතින වර්තමාන ගැටළු සහගත තත්ත්වය විසඳා ගැනීමට වැදගත් වන ආකාරය පැහැදිලි කළ යුතු විය. උදාහරණ ලෙස මෙම සිද්ධියට අනුව තීරණ ගැනීමේ එක් වැදගත්කමක් වන්නේ අභියෝග ජයගැනීමට තීරණ ගැනීම වැදගත් වීමය. එනම් මෙහිදී "**සීමාසහිත ඇග්‍රෝ මැක් පොදු සමාගමේ** අභිමීවන වෙළෙඳපොල කොටස නැවත අත්පත් කරගැනීමේ අභියෝගය ජයගැනීමට විවිධාංගීකරණය කිරීම යන තීරණය වැදගත් වේ" යනුවෙන් පැහැදිලි කළ යුතුය.

මෙහි (b) කොටසින් සිද්ධියට සම්බන්ධ ව්‍යාපාරය සැලසුම් කිරීමේදී එයට මග පෙන්වීම සඳහා සැලසුම්කරණයේ මූලධර්ම 3 ක් පැහැදිලි කළ යුතුව තිබුණි. සැලසුම්කරණයේ මූලධර්ම සහ සැලසුම්කරණයේ ප්‍රභේද (උපායමාර්ගික, උපායක්‍රමික සහ මෙහෙයුම්) වෙන්කර හඳුනා නොගැනීම නිසා උත්තර සැපයීම සතුටුදායක මට්ටමක නොතිබූ බව අනාවරණය විය. මෙම කොටස සඳහා අයදුම්කරුවන් බොහෝ දෙනෙක් අඩු ලකුණු ලබා තිබීම දක්නට ලැබුණි. සැලසුම්කරණයේ මූලධර්ම වෙනුවට වෙනත් මූලධර්මයක් විස්තර කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

මෙහි (c) කොටසින් ව්‍යාපාරික විවිධාංගීකරණය සඳහා පාරිසරික විශ්ලේෂණය සලකා බලනු ලබන්නේ කෙසේදැයි PEST විශ්ලේෂණය භාවිත කරමින් විමසන ලෙස දක්වා තිබුණි. මේ සඳහා ඇතැම් අයදුම්කරුවන් සාර්ථක ලෙස උත්තර සපයා තිබුණද සමහරු අභ්‍යන්තරික පාරිසරික ලක්ෂණ පමණක් ඉදිරිපත් කර තිබුණි. PEST විශ්ලේෂණය වෙනුවට SWOT විශ්ලේෂණය පවා විස්තර කර තිබීම දක්නට ලැබුණි.

මෙහි (d) කොටසින් සංවිධානයේ සඵලදායි නායකයෙකු ලෙස ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රධාන කාර්යයන් 3 ක් පැහැදිලි කිරීම පිලිබඳව විමසා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා ද එතරම් සාර්ථක උත්තර දක්වා නොතිබුණි.

- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම වැඩිදියුණු කර ගැනීම සඳහා සැලකිල්ලට ගතයුතු පොදු කරුණු</u>:**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කාලයක් දෙනු ලැබේ).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සහතික විය යුතුය.

(8) ස්වඅධ්‍යයන පාඩම්මාලා පොත්, ලිපි සඟරා ආදිය කියවිය යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පෙර ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

- * * * -